**දක්ෂිණ මහාමාර්ග ආයෝජන වැඩසටහනේ (එස් එච් අයි පී) - 2013**

**--------------------------------------------------------------------------------**

දක්ෂිණ මහාමාර්ග ආයෝජන වැඩසටහනේ (එස් එච් අයි පී) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.ශ්‍රී ලංකා රජය විසින් ආසියානු සංවර්ධන බැංකුව සමඟ 1995 නොවැම්බර් 09 දින එළඹි ටී ඒ අංක 8271 - එස් ආර් අයි දරන තාක්ෂණික සහාය රාමුව ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**--------------------------------------------------------------------------------------**

එවකට මහාමාර්ග,වරාය හා නාවික අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග,උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය සහ මාර්ග සංවර්ධන අධිකාරිය (මා සං අ) පිළිවෙලින් වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. දක්ෂිණ අධිවේගී මාර්ගයේ ශක්‍යතා අධ්‍යයනයක් හා තාක්ෂණික, වාණිජ, මූල්‍ය, ආර්ථික හා ආරක්ෂක පැතිකඩයන් ඇතුළත් මූලික සැලැස්මක් පිළියෙල කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහාය හා මාර්ග ව්‍යාපෘති සැකසීමේ පහසුකම් සහිතව අධිවේගී මාර්ගය සංවර්ධනය හා මෙහෙයුම් සඳහා ආයතනික හා ප්‍රතිපත්ති රාමුව වැඩි දියුණු කිරීම වැඩසටහනේ අරමුණු වේ. වැඩසටහන සඳහා සහාය වීමට ආසියානු සංවර්ධන බැංකුව විසින් 2012 වර්ෂයේ දි එ ජ ඩො මිලියන 01 ක වෙන්කිරීමක් ලබා දී තිබූ අතර 2013 වර්ෂයේදි උපදේශක කණ්ඩායමක් පත්කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

**-------------------------------------------------**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි.පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්,වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද වැඩසටහනේ වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඇ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ වැඩසටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඉ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනා ගෙන තිබුණේද යන බව, සහ

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

**3. මතය**

**----------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

**4. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**4.1 මූල්‍ය කාර්ය සාධනය**

**--------------------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාලපරිච්ඡේදය තුළ වැඩසටහන් වියදම රු.3,665,498 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විස්තරය | 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දරන ලද වියදම |
|---|---|
| | රු. |
| ව්‍යාපෘති කළමනාකරණ වියදම් | 3,566,528 |
| අත්තිකාරම් | 98,970 |
| | 3,665,498 |

## 5. විගණන නිරීක්ෂණ

වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂය තුළ වෙන්කරන ලද රු. මිලියන 130 කට සමාන එ ජ ඩො මිලියන 01 ක ප්‍රදානයෙන් රු.7,932,990 කට සමාන එ ජ ඩො 61,023 ක සෘජු ගෙවීම් ගිණුම්ගත කර නොතිබුණි. තවද පරිපූරක වෙන්කිරීම් යටතේ රු. මිලියන 45 ක් වූ ප්‍රතිපාදන මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශයේ 2013 වර්ෂය සඳහා වාර්ෂික විසර්ජන ගිණුමේ වැය නොකල ශේෂයක් ලෙස දක්වා තිබුණි.

## 6. මූල්‍ය හා කාර්ය සාධන සමාලෝචනය

### 6.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා අයවැයගත ප්‍රතිපාදන හා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුම යටතේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන | | 2012 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් |
|---|---|---|---|---|---|
| | එ ජ ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ ජ ඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ - ටී ඒ - 8271 එස් ආර් අයි | 01 | 130 | 45 | 0.06 | 7.90 |
| ශ්‍රී ලං ර | - | | 30 | | 3.66 |
| එකතුව | 01 | 130 | 75 | 0.06 | 11.56* |

* වැඩසටහන විසින් සෘජු ගෙවීම් වාර්තා නොකිරීම හේතුවෙන් මෙම වාර්තාවේ 4.1 ඡේදය යටතේ දැක්වෙන ශේෂය සමඟ මෙම සංඛ්‍යාව එකඟ නොවේ.

### 6.2 උපදේශක සේවා

උපදේශකවරුන්ගේ යොමුගත කොන්දේසි අනුව, ඉදිකිරීම් වාර්තා, ආයතනික ප්‍රතිපත්ති රාමුව පිළිබඳ තාක්ෂණික ශක්තිමත් කිරීම හා පුහුණු වැඩසටහන් පිළිබඳ වාර්තා 2013 ජුනි මාසයට පෙර ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද සිදුකළ යුතු පුහුණු වැඩසටහන් පිළිබඳ වාර්තා 2014 ඔක්තෝබර් 31 වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි.